# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 58 — 1973 මැයි 04 වැනි සිකුරාද — 1973.05.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II අ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 533 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 42 |



සැළකිය යුතුයි.—(i) මුද්දර (සංශෝධන) පනත් කෙටුම්පත 1973 අප්‍රේල් 19 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරනලදී, (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන මුදල් හා ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත 1973 මැයි මස 4 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරයෙන් සඳහන් නොකළ හැකි අවස්ථාවක් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

1. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

2. සේවයට කැර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් තෝරාගත්තත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙසු සැවොම ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් ඉතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

(iii) (අ) ඔහුගේ ස්වකීය රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය කොටස් නොවූ අති විශේෂ අවස්ථාවන් හිදී හැර ඔහුගේ ආධුනික/පරිවාස සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ප්‍රයෝජනවත් දැනුමක් ලබා ගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේ දී ඔහුගේ පත්වීම ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර අවසාන පාසැල් සහතික පත්‍ර විභාගයේ භාෂා මට්ටමට වඩා උසස් නොවන තත්ත්වයේ පෙළ අන් වූ හෝ යෙදුම්ත නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ නියමිත කාලච්ඡේදයක් තුළදී සමත් වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයක් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අසමත් වුවහොත් ඒවා සමත් වන තෙක් ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා නැවතීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය හමාර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

සංලක්ෂ්‍යය.—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් වීමෙන් නිදහස් කරනු ලබති.

5. අවශ්‍ය සුදුසුකම්.—(i) සෑම ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයෙකු නොවේනම් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය තුළ සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවන්නේ ය.)

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අනෙක් සෑම අයුරෙකින් සුදුසුකම් ලැබ සිටින්නා වූ මහා රැජිනියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිට සේවාමුක්ත වූ ද අයට සත්‍ය ගිණිය හැකි සේවාව, යහපත් ප්‍රකාර නිර්මාණ සේවාව, සිංහලකාරක සහ සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම අත්හැරියන් හැර) සෑම කෙනෙකුටද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස සේවය කළේ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනසිට ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනක් යන මේ දෑ තුර තමන් සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. මෙතෙක් අවශ්‍ය කරුණු.—(i) දනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම්පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේ නමුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන, සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම තම ඉල්ලුම් පත්‍රය එසේ එවවේ නම්දා ඇති, ඒ සඳහා සපයා ඇති "අ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙලින් ම එවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරා ගනු ලැබුවහොත්) කාර්ය සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසි අනුකූලව ඔවුන්ගේ තනතුරුවලින් මුදාහැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දක්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට කෙනෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන් දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණේ නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණේ නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

### වි අලෙවි මණ්ඩලයේ ඇබෑර්තු

### ලඝු/යතුරු ලේඛක (සිංහල) VII වන ශ්‍රේණියේ III වන පන්තිය

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම අයදුම් පත් ලියාපදිංචි කළ තැපෑලෙන්, 1973. 05. 21 වෙනි දිනට හෝ එදිනට පෙර හෝ, "පරිපාලන අධිකාරී, වි අලෙවි මණ්ඩලය, අංක 5, එලිබෑන්ක් පාර, කොළඹ 5." යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම් පත් බහා එවනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරේ "ලඝු/යතුරු ලේඛක (සිංහල) තනතුරු සඳහා අයදුම් පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

අවශ්‍ය සුදුසුකම්.—

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී සිංහල භාෂාවට සහ ලඝු/යතුරු ලේඛනයට සම්මාන සාමාර්ථයන් ඇතිව වාර දෙකකට නොවැඩි ගණනකදී විෂයයන් 6කින් සමත් වී තිබිය යුතුය.

(ii) අයදුම්කරුවන්ට යටත් පිරිසෙයින් විනාඩියකට වචන 60-80 අතර ලඝු ලේඛන වේගයද, විනාඩියකට වචන 25ක යතුරු ලියන වේගයද තිබිය යුතුය.

(iii) විශේෂයෙන් කර යතුරු ලියන ක්‍රමය ගැන පුහුණුවක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) සම්මුඛ පරීක්ෂණයකදී තෝරාගනු ලබන අයදුම්කරුවන් ලඝු ලේඛන හා යතුරු ලියන පරීක්ෂණයකට පෙනී සිටිය සිටිය යුතුය.

වැටුප් ක්‍රමය.—රු. 265—14×10—2×15—රු. 435 මෙම තනතුර වලට සේවා යෝජකයාගෙන් සියයට 9ක් හා සේවකයාගෙන් සියයට 6ක් බැගින් අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ අදාළ වේ.

පොදු කොන්දේසි :

1. ලාංකිකයින් විය යුතුය.

2. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3ක පරිවාසක කාලය කට යටත් විය යුතු අතර, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විශේෂ විධිවිධාන පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නා හා මතුවට පනවනු ලබන නීති රීති හා ව්‍යවස්ථා වලට යටත් විය යුතුය.

4. රජයේ සේවයේ හා සංස්ථා සේවයේ යෙදී සිටින්නවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එවිය යුතුය.

5. අයදුම්පත් සමඟ අධ්‍යාපන සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුය.

අංක 5, එලිබෑන්ක් පාර,
කොළඹ 5,
1973 මාර්තු මස 4 වෙනි දින.

පරිපාලන අධිකාරී,
වි අලෙවි මණ්ඩලය.

5-67—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

## අධිකරණ සේවා උපදේශක මණ්ඩලය

### ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධාරි තනතුරු

ශ්‍රී ලංකා අධිකරණ සේවයේ ඇබෑර්තු ඇතිවන පරිදි හා ඇතිවන විට එම තනතුරුවලට පත් කිරීම සඳහා සලකා බැලීම ගැන කැමති අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කළ යුතුය.

1972 ජූලි හෝ නොවැම්බර් මස අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ අපේක්ෂකයින් අළුතින් අයදුම් පත් එවීම අවශ්‍ය නොවේ.

සංලක්ෂ්‍යය :

(i) මුද්‍රිත අයදුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට ඉල්ලුම්කරු, රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යන්න ඉතා පැහැදිලිව සඳහන් කොට 9"×4" ප්‍රමාණයට වඩා කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) අයදුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධව ලියමනක් හෝ තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය.

**2. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—පත්වීම් පළමුකොටම තාවකාලික පදනමක් මත වන අතර, එකී පත්වීම් වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප මත වනු ඇත. එසේ පත් කරනු ලැබූ තැනැත්තකුට ස්ථිර පත්වීමක් ලැබීම සඳහා විශේෂ හිමිකමක් නොලැබෙන අතර වැඩ බැලීමේ වර්ෂයක අවම කාල පරිච්ඡේදයකින් පසුව ස්ථිර පත්වීමක් ගැන සලකා බැලීම සඳහා ඔහු සුදුස්සෙකු වන්නේ ය. ස්ථිර පත්වීම අර්ථසාධක අරමුදල් පදනම මතවේ. තෝරාගනු ලැබූ අයදුම්කරු විසින් සිය වැටුපෙන් සියයට 6ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර රජය විසින් සියයට 9ක් ඒ සඳහා ගෙවනු ඇත. ස්ථිර සේවයේ පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයක් මත වන අතර සිංහල භාෂාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ එවැනි වෙනත් විභාගයකදී ලබාගත් සම්මාන සාමාර්ථයකට අඩු නොවන සාමාර්ථයක් දැනටමත් ලබා ඇත්නම් මිස ආධුනික කාලය තුළ සිංහල ප්‍රවීනතා පරීක්ෂණයකින් සමත්විය යුතුය.

**3. වැටුප් සහ දීමනා.**—තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :—

වර්ෂයකට රු. 13,440 කින් පටන්ගෙන රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 5කින් හා රු. 600 වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් වර්ෂයකට රු. 20,640 දක්වා වැඩිවේ. (රු. 17,040 සහ රු. 19,440 යන වාර්ෂික වැටුප්වලට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් ඇත)

පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් අවශ්‍යයයි සලකනු ලබන කල්හි, එබඳු කාල පරිච්ඡේදයක් සඳහා රු. 600ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

**4. සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර—

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයෙකු හෝ නීතිඥයකු වශයෙන් අවුරුදු 6 කට නොඅඩු කාලයක් නියත වශයෙන්ම වෘත්තියේ යෙදී සිටියෙකු හෝ

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු හෝ අධිනීතිඥයෙකු ලෙස නියත වශයෙන් වෘත්තියේ යෙදී සිටි කාලය ද, ගම්බද උසාවි සභාපතිවරයෙකු වශයෙන් සේවා කාලය ද යන දෙකෙහි මුළු එකතුව අවුරුදු දහයකට නොඅඩුව ඇති ගම්බද උසාවි සභාපතිවරයෙකු විය යුතුය.

5. පහත සඳහන් ලිය කියවිලිවලින් කිසිවක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස නියම කළ විටෙක ඒවා අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) උසස්ම අධ්‍යපන සහතිකය, සහ

(ඇ) සිංහලෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් සිය අයදුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම් පත්‍ර හා ඒ සම්බන්ධ වෙනත් ලියකියවිලි අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙත යැවිය යුතුය. එම අයදුම් පත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නොයැවිය යුතුය.

8. අයදුම් පත් ලැබුණ බව දන්වා එවනු ලැබේ. කිසියම් අයදුම්කරුවෙකුට දින 14 ක් ඇතුළත අයදුම් පත ලැබුණ බව දන්වා එවනු නොලැබුවහොත් පහත අත්සන් කර ඇති අය වෙත ඒ බව දැන්විය යුතුය.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

1973 අප්‍රේල් මස 19 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. 573,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

5–6—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

## සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි තනතුරු

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගනු ලබන අයදුම්පත් 1973 මැයි මස 31 වැනි දින හෝ එදිනට කලින් හෝ කොළඹ 1, තැ. පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

සටහන :

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින කීපය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අපේක්ෂකයන් විසින්ම විඳ දරා ගත යුතුය.

**2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජය යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නෙකු නම්, ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :—වර්ෂයකට රු. 7,440—10×360 හා 11×480—රු. 16,320 (රු. 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

සටහන :

(i) නියමිත පශ්චාත් උපාධියකින් සමත් නොවුවහොත්, වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,520 පියවරින් ඔබ්බට යාමට කිසිම නිලධාරියෙකුට හිමිකමක් නැත.

(ii) නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවකු ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයට රු. 8,520 වැටුප් පියවරේ තබනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය හෝ රසායන විද්‍යාව අතිරේක විෂයයක් සහිත උද්භිද විද්‍යාව පිළිබඳ පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ උපාධියක් තිබිය යුතුය.

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය හෝ කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් විෂයයකින් පශ්චාත් උපාධියක් තිබිය යුතුය.

හෝ

(ඇ) උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව සහ සත්ව විද්‍යාව විෂයයක් වශයෙන් පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ උපාධියක් තිබිය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. පශ්චාත් උපාධිධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස අවුරුදු 35 ක් වේ. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමා බල නොපැවැත් වේ.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියකියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

සැලකිය යුතුයි : බවුතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නොලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් : මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සටහන :

(1) අයදුම්පත්වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.

(2) ඉල්ලූ අවස්ථාවක දී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින් ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 අප්‍රේල් මස 19 වැනි දින,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ. පෙ. 1652,
කොළඹ 1.

## ආදර්ශ අයදුම් පත්‍රය

### සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුර සඳහා අයදුම් පත්‍රය

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :——, මාසය :——, දිනය :——.

(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂ :——, මාස :——, දින :——.

4. ඔබ ලංකා රට වැසියෙක් ද ? පාරම්පරික රට වැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :————.

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද ? අවිවාහකද ? වැන්දඹුවක්ද යන බව :——.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද ? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද ? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබූවෙක් ද ? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් : (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතන වල නම් සඳහන් කරන්න) :————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැලකිය යුතුයි : ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා: ————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) ————.

(2) ————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

### රෙදි නිෂ්පාදන ද්‍රව්‍ය නීතිගත සංස්ථාව

#### ඇබෑර්තු

සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා කැඳවනු ලබන අයදුම්පත්, 1973 මැයි මස 18 වෙනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**තනතුර.**—සැපයුම් කළමනාකරු.

වැටුප් ක්‍රමය.—රු. 1,150—50—රු. 1,400 (මාසික).

**අවශ්‍ය සුදුසුකම්.**—(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ආනයන කටයුතු, ප්‍රාදේශීය මිළදී ගැනීම, ටෙන්ඩර් ක්‍රමය සහ වාප්පු නිශ්කාෂණ කටයුතු පිළිබඳ අවුරුදු 7 කට නොඅඩු විධායක තත්ත්වයේ පළපුරුද්දක් තිබිය යුතුය; නැතහොත්,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ එයට සමාන සුදුසුකමක් සහ රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ආනයන කටයුතු, ප්‍රාදේශීය මිළදී ගැනීම්, ටෙන්ඩර් ක්‍රමය සහ වාප්පු නිශ්කාෂණ කටයුතු පිළිබඳ අවුරුදු 12 කට නොඅඩු විධායක තත්ත්වයේ පළපුරුද්දක් තිබිය යුතුයි.

**වයස.**—අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි.

**තනතුර.**—සහකාර සැපයුම් කළමනාකරු.

**වැටුප් ක්‍රමය.**—රු. 800—45—රු. 1,115 (මාසික).

**අවශ්‍ය සුදුසුකම්.**—(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ආනයන කටයුතු, ප්‍රාදේශීය මිළදී ගැනීම්, ටෙන්ඩර් ක්‍රමය සහ වාප්පු නිශ්කාෂණ කටයුතු පිළිබඳ අවුරුදු 3 කට නොඅඩු විධායක තත්ත්වයේ පළපුරුද්දක් තිබිය යුතුයි;

නැතහොත්,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ එයට සමාන සුදුසුකමක් සහ රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ආනයන කටයුතු, ප්‍රාදේශීය මිළදී ගැනීම්, ටෙන්ඩර් ක්‍රමය සහ වාප්පු නිශ්කාෂණ කටයුතු පිළිබඳව අවුරුදු 8 කට නොඅඩු විධායක තත්ත්වයේ පළපුරුද්දක් තිබිය යුතුයි.

**වයස.**—අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි.

**තනතුර.**—සංඛ්‍යා ලේඛන නිලධාරී.

තෝරාගනු ලබන අපේක්ෂකයා සංඛ්‍යාලේඛන කටයුතුවලට අමතරව අමු කපු, කපුනූල්, රෙදි පිළි, සායම් සහ රසායන ද්‍රව්‍ය සඳහා පරීක්ෂණ පැවැත්වීමද කළ යුතු වේ.

වැටුප් ක්‍රමය.—රු. 600—45—915 (මාසික).

**අවශ්‍ය සුදුසුකම්.**—(අ) ගණිතය, භෞතික විද්‍යාව සහ රසායනික විද්‍යාව යන විෂයයන් පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් තිබිය යුතුය. සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අයදුම්පත් ආකෘති ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන් හෝ මුද්දර යක් සහිතව ලිපිනය ලියූ ලියුම් කවරයක් (9″×4″ ප්‍රමාණයේ) එවීමෙන් ලබාගත හැක. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල සේවය කරන අය අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු වේ/සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

සාමාන්‍යාධිකාරී.

රෙදි නිෂ්පාදන ද්‍රව්‍ය නීතිගත සංස්ථාව,<br>
54/4, යෝක් වීදිය,<br>
තැ. පෙ. 621,<br>
කොළඹ 1.<br>
1973 අප්‍රේල් මස 23 වෙනි දින දීය.

5–43—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව

#### නිලධාරි පත්වීම් සඳහා ඇබෑර්තු

**නිලධාරි පත්වීම් සඳහා ඇබෑර්තු—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව**

ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ දෙවන-ලුතිනන් නිලයේ අධිකාරී පත්වීම් සඳහා ඇබෑර්තු තිබේ.

2. ස්වේච්ඡා බලසේනාවේ අධිකාරී පත්වීම් සඳහා ඉල්ලුම්කරන අපේක්ෂකයින්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුවේ:—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

(ආ) 1973 ජූනි මස 01 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩුවද අවුරුදු 30 ට නොවැඩිවද සිටිය යුතුයි.

(ඇ) හමුදාධිපති විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට, නිරෝගීමත් අයෙකු විය යුතුයි.

(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විභාගයෙන් හෝ උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුයි.

**සැලකිය යුතුයි.**—

(i) රජයේ භාෂා ප්‍රතිපත්තියට, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතට අනුකූලව පිළිපැදීමට හැකිවී සිටිය යුතුයි.

(ii) නාම යෝජකයින් ප්‍රථමකොට මාස දෙකක කාලසීමාවක අභ්‍යාසයක් හැදෑරීමට සූදානම් විය යුතුයි. මෙම අභ්‍යාසය සාර්ථක ලෙස අවසන් කළ අයට පමණක් අධිකාරී පිරිනමනු ලැබේ.

3. ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ රෙගුලාසි අනුව ස්වේච්ඡා බල සේනාවේ නිලධාරීන්ට හුදෙක් ඔවුන්ට දරන්නට වන වියදම් පියවා ගැනීමට යම් යම් වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

4. පොදු සේවා නීති රීති, යුද්ධ හමුදා පනතට හා ස්වේච්ඡා බල සේනාවේ ව්‍යවස්ථාවලට අනුකූලවය. හමුදා පනතේ 7 සහ 19 වගන්ති අනුව (357 අධිකාරය) ස්වේච්ඡා සේවකයෙකු සක්‍රිය සේවය සඳහා කැඳවීමට යටත් වනු ඇත. එම සේවය සම්පූර්ණ සක්‍රිය සේවය වන අතර, ඒ සේවා කාලය තුළ දී නිත්‍ය භට හමුදාවේ නිලධාරීන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා ස්වේච්ඡා බලසේනාවේ අයටද ගෙවනු ලැබේ.

5. මෙම ඇබෑර්තු නිත්‍ය භටසේනාවේ නොව ස්වේච්ඡා බල සේනාවේ බවත් තෝරා ගැනීම් වැටුප් ලබන ස්ථිර රැකියාවක් නොවන බවත් අවධාරණයෙන් දැනුම් දෙනු ලැබේ.

6. සහතිකවල පිටපත් සමග ඉල්ලුම්පත්, තම දිස්ත්‍රික්කයේ ආදායම් පාලක නිලධාරියගේ හෝ ග්‍රාමසේවකයාගේ හෝ චරිත සහතිකයක් ඇතුලත්ව, අයදුම්කරු පුද්ගලිකව හඳුනන වැදගත් තැනැත්තන්ගෙන් පසුගිය අවුරුදු දෙක ඇතුලත ලබාගත් චරිත සහතික දෙකක් සමග අමුනා එවිය යුතුයි.

7. අධික ඉල්ලුම්පත් ගණනක් ලදහොත් ඉහත සඳහන් කොන්දේසි අනුව සුදුසුකම් ඇති අය අතුරින් මූලික තේරීමක් කරනු ලැබේ. මෙම අයදුම්කරුවන්ට, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුව අවසන් තෝරා ගැනීම පවත්වනවා ඇත. සම්මුඛ පරීක්ෂණයට තෝරාගන්නා අයදුම්කරුවන්ට, එය පවත්වන ස්ථානයත්, දිනයත්, වේලාවත් ලියා දන්වනවා ඇත. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් දෙනු නොලැබේ. තේරීම් මණ්ඩලයේ සම්මුඛ පරීක්ෂණයට තෝරා නොගන්නා අයදුම්කරුවන්ට ඒ බව දන්වනු ලැබේ.

8. ඉල්ලුම්පත් පහත දක්වා ඇති ප්‍රකාර ඉල්ලුම්කරුවන්ගේම අත් අකුරින් පිළියෙල කර, ස්වේච්ඡා ශාඛාව, යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ කියා ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතෙහි සහ එය බහාලන කවරයෙහි වම් උඩ කෙළවරෙහි "ඉල්ලුම්පත්‍රය—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—අධිකාරී පත්වීම්" කියා සඳහන් කළ යුතුයි. ඉල්ලුම්පත් 1973 ජූනි මස 01 වැනි දින පස්වරු 4.00 ට ප්‍රථම යුද හමුදා මූලස්ථානය වෙත ලැබිය යුතුයි.

**සැලකිය යුතුයි.**—

(1) ඉල්ලුම්පතට අමුනා එවිය යුත්තේ සහතිකවල පිටපත් විනා මුල් පිටපත් නොවන බව දන්වා සිටිනු ලැබේ.

(2) ඉල්ලුම්පත් මෙම මූලස්ථානයෙන් නිකුත් කරනු නොලැබේ.

කොළඹ,<br>
තැ. පෙ. 553.<br>
යුද හමුදා මූලස්ථානයේ දී ය.<br>
1973 අප්‍රේල් 23 වැනි දින.

එම්. ඒ. ජයවීර,<br>
බ්‍රිගේඩියර්,<br>
යුද්ධ හමුදාධිපති වෙනුවට.

**ඉල්ලුම්පත්‍රය—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—අධිකාරී පත්වීම්**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ඉතා ආසන්න තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.

4. ඉතා ආසන්න පොලිස් ස්ථානය :————.

5. ඡන්ද කොට්ඨාශය :————.

6. උපන් දිනය :————. වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

7. ජාතිය :————.

8. හමුදා, නාවුක, ගුවන් හමුදා, ස්වේච්ඡා සේවය ආදියෙහි සම්පූර්ණ විස්තර හා ඒ කාල සීමාවන් හා ඒවායේ දැරූ නිලයන් (තිබේනම්) :
————.

9. විෂයයන් හා දිනයන් ඇතුළුව සමත් කළ විභාගයන් :————.
(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

10. උස අඩි :——, අඟල් :——.

11. විවාහකද ? අවිවාහකද ? :————.

12. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබා ගත් ක්‍රීඩා ශූරතාවයන්:
————.

13. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තියක් ලැබූ වෙනත් නිපුනත්වයන් :————.

14. ඔබේ පාසැල් හා විශ්ව විද්‍යාල කාල සම්බන්ධ පහත සඳහන් විස්තර සපයන්න :—

පාසලේ හෝ විශ්ව විද්‍යාලයේ නම :————.

ඇතුලත්වූ දිනය :————.

අස්වූ දිනය :————.

සමත් කල ප්‍රසිද්ධ විභාගයන් :————.

15. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අසවූ දින සිට යෙදී සිටි රක්ෂාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—

| දුන් සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ තත්ත්වය | කාලය සිට | කාලය දක්වා |
|---|---|---|---|
| | | | |

16. චරිත සහතික ලබාගෙන තිබෙන අයගේ නම් සහ ලිපිනයන් :————.

(චරිත සහතිකවල පිටපත් අමුනා එවිය යුතුයි).

17. ඉල්ලුම්කරුගේ අත්සනින් කර සිටින ප්‍රකාශය :—

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයන ලද පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5-7—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව**

ඇබෑර්තුව

**ලේකම් තනතුර**

මෙම සංස්ථාවේ ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **වැටුප් පරිමාණය.**— රු. 1,350—6×50—රු. 1,650 (සියලු දීමනා අඩංගු මාසික)

2. **වයස් සීමාව.**—අවුරුදු 30—45.

3. **අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් සහ අවශ්‍යතා.**—1. විධායක තනතුරක අඩුම වශයෙන් වසර 5 ක පළපුරුද්ද සමග පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වීම හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කිරීමේ හැකියාවක් තිබිය යුතුය ; හෝ

2. අඩුම වශයෙන් වසර 5 ක පළපුරුද්ද ඇති අධිනීතිඥයෙකු හෝ නීතිඥයෙකු විය යුතුය.

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථා කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල පිළියෙල කෙරුන අයදුම්පත් කොළඹ 5, 2බී, ද පොන්සේකා පාරේ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති වෙත 1973 මැයි 15 දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයෙන් පෞද්ගලිකව ද ලිපිනය සහිත මුද්දර ගැසූ 9"×4" ප්‍රමාණයේ කවරයක් සභාපති වෙත එවීමෙන් ද අයදුම්පත් ලබාගත හැක.

අයදුම්පත් ලැබුන බව දන්වනු නොලැබේ.

සභාපති,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

**2බී, ද පොන්සේකා පාර,**
**කොළඹ 5, 1973 අප්‍රේල් 23 දින.**

5-68—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ධීවර සංස්ථාව**

සංස්ථා සේවයේ IV වන ශ්‍රේණියේ ආහාර කාර්මික ශිල්පී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් ක්‍රමය.**—මසකට රු. 720—40×7, 50×5—රු. 1,250 (සියල්ල අඩංගු).

**සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යා විෂයයද සහිතව ලබාගත් විද්‍යා උපාධියක් සහ මසුන් හා මුහුදු ද්‍රව්‍ය නිෂ්පාදන සකස් කිරීම පිළිබඳ වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන.**—උපාධිය ලැබීමෙන් පසුව ආහාර කාර්මික ශිල්පය පිළිබඳව ඩිප්ලෝමාවක් හෝ උපාධියක් තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ. ආහාර ද්‍රව්‍ය තත්ත්ව පාලනය පිළිබඳ දැනීමක් තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ද, විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දැනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවලට ද තෝරාගනු ලබන අපේක්ෂකයන් අනුකූල විය යුතුය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ පියවරක් මත තැබීම ගැන සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවාවේ හෝ මණ්ඩල/සංස්ථාවල නියුතු නිලධාරීන් විසින් එවන අයදුම්පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු හා මණ්ඩල/සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළුව සියළුම විස්තර සඳහන් කොට සහතිකවල පිටපත් ද අයදුම්පත්වලට අමුණා 1973.05.18 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

සේවක මණ්ඩල කළමනාකාර.

රොක්හවුස් පටුමග,
මෝදර,
කොළඹ 15.

5-10—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සේවාවේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සලකා බැලීම පිණිස ඉල්ලුම්පත් එවන මෙන් ශ්‍රී ලංකා ජනරජයේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

(i) III වෙනි ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර.

(ii) V වෙනි ශ්‍රේණියේ ගිණුම් සහ ගණන් පරීක්ෂක නිලධාරි තනතුරු.

**(1) III වෙනි ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර :**

(අ) **වැටුප් ක්‍රමය.**—(සියළු දීමනාවන් ඇතුළුව) මසකට රු. 1,100—රු. 50—රු. 1,700 (රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩයිම.)

(ආ) **වෘත්තීය සුදුසුකම් සහ වයස :**

(i) 1973. 05. 21 වෙනි දිනට වයස අවුරුදු 35 නොඉක්මවූ, යටත් පිරිසෙයින් අවුරුදු 4 ක පළපුරුද්දක් ලබා ඇති අධිනීතිඥවරුන්.

(ii) සිංහල ප්‍රවීණතාවය ලබා සිටීම අතිරේක සුදුසුකමක් වන්නේ ය.

**(2) V වෙනි ශ්‍රේණියේ ගිණුම් සහ ගණන් පරීක්ෂක නිලධාරි තනතුරු:**

(අ) **වැටුප් ක්‍රමය :** (සියළු දීමනාවන් ඇතුළුව) මසකට රු. 600—රු. 40×10—රු. 1,000 (රු. 800 ට සහ 920 ට පෙර කාර්යක්ෂමතා කඩයිම.)

(ආ) **සුදුසුකම් :**

(i) වයස : 1973. 05. 21 වෙනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ii) වෘත්තීය :

(අ) වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වීම,

හෝ

(ආ) පිරිවැය හෝ කර්මාන්ත ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ I, II, හා III වෙනි කොටස් වලින් සමත්වීම,

හෝ

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා විභාගයෙන් සමත්වීම,

හෝ

(ඈ) ඊට සමාන විභාගයකින් සමත්වීම, සමග ගණකාධිකාරී කටයුතු හදාරණ ලිපිකරුවෙකු වශයෙන් සේවය කළ යුතු කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ අඩුම වශයෙන් අවුරුදු 5 ක් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක ගිණුම් හෝ ගණන් පරීක්ෂණ කටයුතුවල යෙදී සිටීම.

2. (අ) රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 නෝ 48 අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකී.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැළකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත් කිරීමට) තේරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

3. **සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයින් 1 වෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසි වලට යටත් විය යුතුයි.

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(2) දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසක කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 6 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 9 කි.

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.

4. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1973. 05. 21 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුළ පාරේ,
අංක 200 වෙනි ස්ථානයේදී ය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### (ඉල්ලුම්පත්‍ර පෝරමය)

1. ඉල්ලන තනතුර :————.

2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නාම :————.

3. ලියුම් ලැබෙන පිළිවෙල :————.

4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න.)

5. 1973. 05. 21 දිනට වයස :—
අවුරුදු :——, මාස :——, දවස් :——.

6. ලාංකිකයෙකුවූයේ පෙළපතින්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග :————.

7. විවාහකද, අවිවාහකද යන බව :————.
(විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න.)

8. ද්විතීය පාඨශාලා අධ්‍යයනය :————,
(ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද දිනයන් සහිතව සඳහන් කරන්න.)

9. උසස් අධ්‍යයනය (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න) :————.
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.)

10. කාර්මික/වෘත්තීය සුදුසුකම් : (ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත්වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.) :————.
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.)

11. (පාසැලෙන් අස්වූ දා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම්, දරූ පදවියේ හා සේවා යෝජකයාගේ නාම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු) :————.

12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර : (දරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළු වූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න) :————.

13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
(මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂෙප විස්තරයක් ලියන්න.)

14. සිංහල භාෂාවෙන් සමත්වී ඇති ඉහළම ප්‍රමාණය :————.

15. මීට කළින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිපලය කුමක්ද? :————.

16. සෙසු විස්තර :————.

17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙක් වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.

18. ඔබ ගැන තොරතුරු දැනගැනීමට සුදුසු නෑනැත්තන් දෙදෙනෙකුගේ නාම හා ලිපිනයන් සඳහන් කරන්න :——
1. ————.
2. ————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

5–53—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

පුරප්පාඩු

වලවේ යෝජනා ක්‍රමයෙහි විශේෂ වැඩ කොටස් සඳහා ඉඩම් පරිපාලනය පිළිබඳ පළපුරුදුකම් ඇති දෙදෙනෙකුගේ සේවය ලබාගැනීමට ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය අපේක්ෂා කරයි. අයදුම්කරුවන් හට ඉඩම් සුපරිපාලනය පිළිබඳව අවුරුදු තුනක මාණ්ඩලික නිලධාරි තත්ත්වයේ පළපුරුද්දක් තිබිය යුතු අතර; ක්ෂෙත්‍ර කටයුතු ඉටු කිරීමට හැකිවන පරිදි මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුයි.

තෝරාගනු ලැබූ අය යෝජනා ක්‍රම පෙදෙස තුළ පදිංචි විය යුතුයි. පත්වීම් කොන්ත්‍රාත් ක්‍රමය මත විශේෂ කාලයක් සඳහා කරන අතර, මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

වයස, පළපුරුදුකම් සහ තමන් දැරූ තනතුරු පිළිබඳ විස්තර දක්වෙන අයදුම්පත් 1973 මැයි මස 15 වෙනි දිනට පෙර මෙහි පහත අත්සන් කරන ලද අය වෙත එවිය යුතුයි.

බී. සී. පෙරේරා,
සභාපති,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7, 1973.4.24.

5–70—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව**

ඇබෑර්තුවක්

**කොම්ටොමීටර් යන්ත්‍ර ක්‍රියා කරවන්නකුගේ තනතුර**

ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ කොම්ටොමීටර් යන්ත්‍ර ක්‍රියා කරවන්නකුගේ තනතුර සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් ලත් ලාංකිකයන් වෙතින් අයදුම් කැඳවේ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

අංක ගණිතය ඇතුළු විෂයයන් හයකින් සාමාර්ථය ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය

හා

කොම්ටොමීටර් යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව අවුරුදු දෙකක පළපුරුද්ද ඇති අය විය යුතුයි. (කොම්ටොමීටර් යන්ත්‍ර ක්‍රියා කරවීම ගැන පිළිගත් ආයතනයක පුහුණුවීමේ පංතියක පුහුණුව සම්පූර්ණ කර ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

**වයස :** අවුරුදු 20-35 දක්වා.

**වැටුප් පරිමාණය :** $\frac{\text{රු. 230—රු. 350}}{\text{රු. 10×12}}$ සියළු දීමනා අඩංගු (මාසික)

නම, ලිපිනය, වයස, අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ආදිය ඇතුළත් අයදුම් පත්, තමන්ගේ සහතිකවල පිටපත් සමගින් 1973 මැයි 11 දිනට හෝ ඊට පෙර, කොළඹ, තැ. පෙ. 337, ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව, සාමාන්‍යාධිකාරී යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව.

5–59—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශය**
ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥ තනතුර

වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥ තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආකෘති පත්‍රයේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත් පහත සඳහන් දින යන්ට හෝ ඊට පළමු ලැබෙනසේ කොළඹ 1, තැපැල් පෙට්ටිය 512, වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. එම ඉල්ලුම් පත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලිපි කවරයේ ඉහළ වම් කෙලවර "ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ තනතුර" යනුවෙන් පැහැදිලිව ලිවිය යුතුය.

(අ) දේශීය ඉල්ලුම් පත්‍ර 1973. 06. 04

(ආ) විදේශීය ඉල්ලුම් පත්‍ර 1973. 06. 11

සටහන :

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින යන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර, වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලත දී බාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරාගනු ලැබූ අපේක්ෂකයා විසින් ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. රජයේ දායක මුදල ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් වනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය.—වර්ෂයකට (ඒකාබද්ධ) රු. 17,040—600×3—රු. 18,840.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1973 06. 11 වැනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩු බවට සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **මෙම වයස්** සීමාව රජයේ සේවකයන්ට අදාල නොවනු ඇත.

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳ පළමුවන හෝ දෙවන පෙළ ගෞරව උපාධියක් හෝ ආර්ථික විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක්.

(ඈ) ප්‍රවාහන ආර්ථික විද්‍යාව පිළිබඳව අඩු වශයෙන් එක් අවුරුද්දකවත් පශ්චාත් උපාධි පාඨමාලවක් හදාරනු ලැබ, පිළිගත් විශ්ව විද්‍යාලයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ ප්‍රධාන විෂයය වශයෙන් ප්‍රවාහන ආර්ථික විද්‍යාව සහිතව උසස් උපාධියක්.

(ඉ) මහාමාර්ග යෝජනා ක්‍රම හඳුනාගැනීම, තෝරාගැනීම, පිළියෙල කිරීම සහ තක්සේරු කිරීම හා අදාල ක්ෂෙත්‍රයේ අවුරුදු 10 ක විධායක තත්ත්වයේ පළපුරුද්දක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය, (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂවරයාගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සටහන :**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුනගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම අමාත්‍යාංශයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයයි නිර්දේශ නොකරතහොත්, සලකා බලනු නොලැබේ.

7. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II (අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

එම්. චන්ද්‍රසේන,
වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග
අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ 1, මහලේකම් කාර්යාලයේ,
වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේදීය.

**ජ්‍යෙෂ්ඨ අභි ශාස්ත්‍රඥ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) (අ) උපන් දිනය :————.

(ආ) 1973. 06. 11 දිනට වයස :————.

අවු :——මාස :——දින :——.

4. ජාතිය:————.

(අ) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන්ද, පරම්පරාවෙන්ද යන වග :————.

(ආ) ලාංකිකත්වය පරම්පරාවෙන් නම් පහත දැක්වෙන අය උපන් ස්ථානය සඳහන් කරන්න :—

(i) අයදුම්කරු :————.

(ii) අයදුම්කරුගේ පියා :————.

(iii) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවකද යන වග :————.

6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහලම විභාගය :————.

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

8. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේද ?

ණය ගෙන සිටින්නේ නම්, ඒ කොපමණද ? ————.

9. ඔබ සාපරාදී වරදකට උසාවියේදී චෝදනා ලැබුවෙක්ද ? එසේ නම්, දිනයත් හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :————.

10. දැනට කරන රැකියාව හා ඊට ප්‍රථම කරන ලද රැකියාවන් (විස්තර සඳහන් කරන්න) :————.

11. වෙනත් තොරතුරු කිසිවක් වේ නම්:————.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකල හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–41—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

2. **ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර :**

**සුදුසුකම්.**—ආරක්ෂක සංවිධාන ආයතනයක වර්ෂ 8 කට නොඅඩු විධායක තත්ත්වයේ පළපුරුද්දක් ඇති උපාධිධාරියකු හෝ සන්නද්ධ සේවාවන්හි අධිකාරයක් ලැබීමෙන් පසුව හය අවුරුද්දක පළපුරුද්දක් ඇති නිලධාරියකු හෝ රාජ්‍ය නිවේදිත කිරීමෙන් පසු අවුරුදු හයක පළපුරුද්දක් ඇති පොලිස් නිලධාරියකු.

3. **වැටුප් ක්‍රමය.**—මසකට සියල්ල අඩංගුව රු. 1,350—5×50—රු. 1,600.

4. **රාජකාරී වේලාව.**—වැටුප් ක්‍රමය පිළියෙල කර ඇත්තේ පැය 12ක සාමාන්‍ය සේවයේ යෙදවීමේ පදනම මතය. එතකුදු වුවත්, තෝරාගනු ලබන නිලධාරියා දවසේ පැය විසිහතර තුල ඕනෑම වේලාවක රාජකාරිය සඳහා කැඳවුවහොත් ඒ සඳහා ඉදිරිපත් වීමට සූදානම් අයෙකු විය යුතුය.

5. අයදුම්පත් නියමිත ආකෘති පත්‍රයන්හි විය යුතු අතර, ඒවා මෙම කාර්යාලයට පැමිණ හෝ ලිපිනය ලියූ මුද්දර අලවන ලද කවරයක් එවීමෙන් හෝ ලබාගත හැකිය. අයදුම්පත් කළමනාකාර (පිරිස් හා පාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, තැ. පෙ. 194, 120 ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් 1973.05.18 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල නියුක්ත වූවන්ගේ අයදුම්පත් එකී දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

එස්. බී. සී. හලාල්දීන්,
කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

තැ. පෙ. 194,
120, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

5–51—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**නිවැරදිකිරීම**

සේද කර්මාන්ත සහායක සහතුරු

1973 මාර්තු මස 30 වෙනි දින හා අංක 53 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ—395 සහ 396 වෙනි පිටුවල පළ වූ දැන්වීමට අදාල වැටුප් ක්‍රමය පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුයි :—

"ඒකාබද්ධ වැටුප :—අවුරුද්දකට රු. 3,864—144×19 සහ 180×4—රු. 7,320 (අවුරුද්දකට රු. 4,584—සහ රු. 6,024 ට පෙර කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක වේ.)"

5–1203—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

#### ඇබෑර්තු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. නම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබාගන්නා ඉල්ලුම් පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

1. වාරිමාර්ග නිලධාරි—IV වැනි ශ්‍රේණිය

**වේතන පරිමාණය:** රු. 800—10×40—1,200 සියළු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—

(අ) පිළිගත් කාර්මික ආයතනයක ජේෂ්ඨ/කාර්මිකයින් පිළිබඳව (සිවිල්) විභාගය සමත්ව තිබීම

හෝ

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්මික විභාගය හෝ රජයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවක උප පරීක්ෂක තත්වයේ විභාගයෙන් සමත්ව තිබීම

සහ

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංයුක්ත මණ්ඩලයක කාර්මික සහකාරවරයකු වශයෙන් හයිඩ්‍රොලික් ඉංජිනේරු වැඩ පිළිබඳව පරීක්ෂා කිරීම හා ඉදිකිරීම් සම්බන්ධව අවුරුදු (7) හතකට නො අඩු පළපුරුද්දක් තිබිය යුතුය.

සහ

(ඇ) මැනීම හා ලෙවල් කිරීම, ඇළ මාර්ග සිතියම් හා සම්බන්ධිත නිර්මාණයන් පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

2. වාරිමාර්ග සහකාර—VI ශ්‍රේණිය

**වේතන පරිමාණය:** රු. 450—14×25—800 සියළු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—කණිෂ්ඨ කාර්මික නිලධාරී විභාගයෙන් සමත්ව තිබීම හෝ ඒ හා සමාන පිළිගත් කාර්මික ආයතනයකින් ලබාගත් සහතිකයක් තිබීම

හෝ

අවුරුදු දෙකක පළපුරුදුකම සහිතව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර පුරුදුවන්නන්/පුහුණුවන්නන් විය යුතුය.

3. නිෂ්පාදන සහකාර—VII වැනි ශ්‍රේණිය

**වේතන පරිමාණය.**—තෝරාගනු ලබන අයදුම්කරුවන් දෙවර්ෂයක පුහුණුවීමේ කාලයක් මත තබනු ලබන අතර, එම කාල පරිච්ඡේදය තුළ ඔවුන්ට රු. 350 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. සතුටුදායක ලෙස පුහුණුවීම සම්පූර්ණ කළ පසු ඔවුන් රු. 350—15×20—650 ක් වන සියලු දීමනා අඩංගු මාසික වැටුප් පරිමාණයකට පත් කරනු ලැබේ.

**සුදුසුකම්.**—රසායන විද්‍යාව භෞතික විද්‍යාව සහ ගණිතය යන විෂයයන් සහිතව අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් සමත් වී සිටීම.

තෝරාගනු ලබන අයදුම්කරුවන් පුහුණුවීමේ කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු පහක් (5) සංයුක්ත මණ්ඩලයේ සේවය කරන බවට සංයුක්ත මණ්ඩලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

4. ක්ෂේත්‍ර සහකාර—VII ශ්‍රේණිය

**වේතන පරිමාණය.**—රු. 350—15×20—650 සියලු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සහතිකයක් සමග කුණ්ඩසාලේ ගොවිකම් පාසැලේ හෝ සමාන පිළිගත් ආයතනයක ඩිප්ලෝමා/සහතිකයක් තිබිය යුතුය.

පළපුරුද්දක් නොමැති නවක අයදුම්කරුවන් දෙවර්ෂයක පුහුණුවීමේ කාලයක් මත තබනු ලබන අතර, එම කාල පරිච්ඡේදය තුළ ඔවුන්ට රු. 350 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. සතුටුදායක ලෙස පුහුණුවීම සම්පූර්ණ කළ පසු ඔවුන් රු. 350—15×20—650 ක් වන සියලු දීමනා අඩංගු මාසික වැටුප් පරිමාණයක පත් කරනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් පුහුණුවීමේ කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු පහක් සංයුක්ත මණ්ඩලයේ සේවය කරන බවට මුදල් ඇපයක් සහිතව සංයුක්ත මණ්ඩලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වන වේතන පරිමාණවල සුදුසු පියවරකට තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාන හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයයේ ඕනෑම ආයතනයක සේවය කිරීමට ද සූදානම් විය යුතුය. ඔවුන් විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ද ලබාගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි ප්‍රධානීන් මගින් අයදුම්පත් එවිය යුතුය.

අයදුම්පත් ලියා පදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයය, තැ. පෙ. 1486, 651, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1973 මැයි මස 19 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

1973 අප්‍රේල් මස 24 වැනි දින,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
651, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ-5.

5–56—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/60/27 (ජ).

### යතුරු ලේඛක සේවයේ සාමාන්‍ය ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1973 ජූලි

**විභාගය පවත්වන දිනය.**—යතුරු ලේඛක සේවයේ සාමාන්‍ය ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගයක්, සිංහලෙන් යතුරු ලිවීම මැනවින් දත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයින් සඳහා 1973 ජූලි මස 7 වැනි දින විභාග කොමසාරිස් විසින් පහත සඳහන් මධ්‍යස්ථානයන් හිදී පවත්වනු ලැබේ :—

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත | ... | කොළඹ; ගම්පහ, කළුතර, අවිස්සාවේල්ල, මීගමුව. |
| මධ්‍යම පළාත | ... | මහනුවර, මාතලේ, නුවරඑළිය. |
| දකුණු පළාත | ... | අම්බලන්ගොඩ, ගාල්ල, මාතර. |
| උතුරු පළාත | ... | යාපනය, වවුනියාව. |
| නැගෙනහිර පළාත | ... | මඩකලපුව, ත්‍රිකුණාමලය. |
| වයඹ පළාත | ... | හලාවත, කුරුණෑගල. |
| උතුරු මැද පළාත | ... | අනුරාධපුරය. |
| ඌව පළාත | ... | බදුල්ල. |
| සබරගමුව පළාත | ... | කෑගල්ල, රත්නපුරය. |

අපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති කිසියම් මධ්‍යස්ථානයක් වේතොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත.

2. **ඇබෑර්තු සංඛ්‍යාව.**—පත්වීම් දීම සඳහා තෝරාගත් අපේක්ෂකයින්ගේ නම් ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබේ.

3. **සේවා කොන්දේසි.**—(i) සාමාර්ථ්‍ය ලද අපේක්ෂක/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයක් මත මෙම සේවයට පත් කරනු ලැබේ. ඔවුන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් රහිතය.

(ii) මේ විභාගයේ ප්‍රතිඵල අනුව යතුරු ලේඛක සේවයට පත් කරනු ලබන අය ස්ථාන මාරු කිරීම්වලට යටත් ය. එසේම ලංකාවේ ඕනෑම ස්ථානයකට පත් කොට යවනු ලැබීමට ද යටත් වේ.

(iii) සාමාර්ථ්‍යය ලැබූ අය 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලට ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථා වලටද මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලට ද එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය බාර පරිපාලන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. ඉල්ලුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාගශාලාවක දී කිසිම අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

ප්‍රවේශ පත්‍රය සමග කාල සටහනෙහි පිටපතක් ද අපේක්ෂකයන් වෙත යවනු ලැබේ. විභාගයට පෙනී සිටින් නාවූ සෑම අපේක්ෂකයකු විසින්ම විභාගය පවත්වන දිනයෙහි ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග පරිපාලක වෙත බාරදිය යුතුය.

සියළුම විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනය අග පළවේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටිති.

යම්කිසි ඉල්ලුම්කරුවකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ඔහු විසින් ඒ බව වහාම—

කොළඹ 2, මැලේ වීදිය, තැ. පෙ. 1503, විභාග කොමසාරිස්, යන ලිපිනයට දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය "විභාග" කොළඹ, කියා වේ.) ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව විභාග කොමසාරිස් වෙත දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුය :—

(1) විභාගයේ නම ;
(2) සම්පූර්ණ නම ;
(3) සම්පූර්ණ ලිපිනය ;
(4) විභාග මධ්‍යස්ථානය ;
(5) තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය සහ අයදුම් පත තැපැල් කළ දිනය.

ප්‍රවේශ පත්‍රය ගැන කාර්යාලයට පැමිණ විමසන්නේ නම්, කොළඹ 2, ශ්‍රීමත් රත්නජෝති සරවනමුත්තු මාවතේ අංක 130 දරණ තැන පිහිටි විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රවේශ පත්‍ර ශාඛාවට පැමිණිය යුතුය.

(ii) විභාගයට ඇතුලත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතුය.

විභාග කොමසාරිස්ට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයෙකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස තාවකාලික අවසර දිය හැකිය. එසේ දෙනුලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

9. **හැඳින්වීමේ පත්‍ර.**—අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී, තමන් පෙනී සිටින සෑම විෂයක් පාසාම, විභාග පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත් ;

(ආ) විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්) ;

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ පොදු සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරුගේ ඡායා රූපයක්ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක් ;

(ඉ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරන ඡායාරූපයක්:— පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්තන් කර ඇති .................................. (අයදුම්කරුගේ සම්පූර්ණ නම) ......................යන අයගේ බව මම සහතික කරමි.

..........................
(අයදුම්කරුගේ පුරුදු අත්සන)

..........................
(අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන)

..................
(නම සහ තරාතිරම)

දිනය :...........................

(මෙම සහතික කළ ඡායාරූපය විභාග ශාලාධිපති විසින් රඳවා ගනු ලැබේ).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි ඉල්ලුම්කරුවකුගේ අපේක්ෂකත්වය තාවකාලිකය. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) අයදුම් පත සමග කිසිම ලිපි ලේඛනාදියක් නොඑවිය යුතුය. එහෙත් නියමකොට ඇති පරිදි අවශ්‍ය සියළුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන සියළුම කරුණු වලින් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍රයක් වුවහොත් එහි අන්තර්ගත කරුණු උඩ පමණක් සලකා බලා ප්‍රතික්ෂෙප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපේක්ෂකයින් විසින් තමන්ගේ යෝග්‍යතාව, ලියකියවිලි වලින් ඔප්පු කළ යුතුය. එබඳු වූ අපේක්ෂකයන් එම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වුවහොත් එම අවස්ථාවේදී ඉදිරිපත් කිරීම හෝ නොඑසේ නම් විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීම හෝ කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලි අවශ්‍ය විය හැකිය—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සංලක්ෂ්‍යය**—අපේක්ෂකයා/අපේක්ෂිකාව ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවකින් ළඟදී අස්වී හෝ සිටී නම් චරිත සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි. නොඑසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චය කාරයෙක්, අධිනීතිඥයෙක්, නීතිඥ කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 4,800 ක් හෝ ඉන් වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකටව දන්නා, කෙලින්ම තොරතුරු ලබා ගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරෙකුගෙන් වුවද, ලබාගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම හා ලිපිනයද එහි පැහැදිලි සේ සඳහන්ව තිබිය යුතුය. ආණ්ඩුවේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ උප්පැන්නය ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් (කිසියම් අපේක්ෂකයෙකුහට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම් එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සළකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දිනය.)

**සංලක්ෂ්‍යය**—(i) පාඨශාලාවක භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරනු ලබන විශේෂ උප්පැන්න සහතිකය හෝ උප්පැන්න සහතික ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ බාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බව්තීස්ම පත්‍ර බාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම්/නම හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේදී පෙනී සිටින නම්/නම හා අතර වෙනසක් වේ. නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (110 වැනි පරිච්ඡේදයේ) අංක 27 හෝ 28 දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්නයෙන් දැක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කට යුතු කළ යුතුය. 1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ ප්‍රකාර ස්වකීය නාම වෙනස් කළ දැනට ආණ්ඩුවේ තනතුරු දරන අපේක්ෂකයින් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතික පත්‍රයක් හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දැක්වෙන සහතිකයක් (උචිත පරිදි).

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකපත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැතහොත් ඊට අදාල වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (උදා : පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්.)

(ඉ) හේවා පන්නයට අයත් නොවූ සේවකයෙකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතික හෝ යුද හමුදාවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 6 (ඈ) ඡේදයෙහි දැක්වුණු අපේක්ෂකයන් කෙරෙහි ය.)

(ඊ) ආණ්ඩුවේ සේවය පිළිබඳ ලබාගත් සහතිකය. (මෙය අවශ්‍ය වන්නේ මෙහි 6 (ඈ) වැනි ඡේදයෙහි දැක්වුණු අපේක්ෂකයින් සම්බන්ධයෙනි.)

(උ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ සඳහා ද මෙය රැගෙන ආ යුතුය.)

(iv) විභාගය ඉල්ලුම් කරන අවස්ථාවේ දී වුවමනා සියළුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වෙතොත් ඒ අවස්ථාවේ දී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්නට අපොහොසත් වන හෝ විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයෙකු වෙතොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**11. අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

අපේක්ෂකයෙකු විසින් ඔහු දැනුවත්වම අසත්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කාරණයක් සිතාමතාම යටපත් කළ බවක් හෝ එසේ නැතහොත් ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකු ව සිටි බව ඔහුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් ඔහු වහා සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

**12. මුදල් ආපසු ගෙවීම.**—කිසිම කරුණක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය වෙනුවෙන් ගෙවන ලද ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කළ හැකි ද නොවේ.

**13. රජයේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—**විභාග කොමසාරිස් විසින් අනුමත කරන ලද අයදුම්පත් ඇති, රජයේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිවාඩු (රාජකාරි නිවාඩු නොවේ) දිය යුතු ය.**

**14. විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්තය. I වැනි කොටස ලිඛිත පරීක්ෂණයකි. II වැනි කොටස වාචික පරීක්ෂණයකි. විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයය වෙනුවෙන් නියමිත ලකුණු පහත දැක්වේ. ලිඛිත පරීක්ෂණයේ දී නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයින් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

### I වැනි කොටස

| | | ලකුණු |
|---|---|---|
| (1) සිංහල යතුරු ලිවීම (අඩුම වේගය විනාඩියකට වචන 20 බැගින් යතුරු ලිවීම) | විනාඩි 20 යි | 150 |
| (2) සාමාන්‍ය දැනීම | විනාඩි 30 යි | 50 |

සැළකිය යුතුයි.—

(i) පරීක්ෂණය පැවැත්වෙන දින දී ප්‍රයෝජනය සඳහා තමන්ගේම යතුරු ලියන යන්ත්‍ර රැගෙන ආ යුතුය.

(ii) එසේ කළ නොහැකි අපේක්ෂකයින්ට තම තමන් අතරේ එක යතුරු ලියන යන්ත්‍රයක් පාවිච්චි කිරීමට පිළියෙල කර ගැනීමට ඉඩදෙනු ලැබේ. එක් දිනක දී එක් යතුරු ලියන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙල කර ගන්නා අපේක්ෂකයන්ගේ ගණන හතරකට වැඩිවිය යුතු නොවේ. එසේ කරන අපේක්ෂකයින් ඔවුන් අතුරෙන් පළමුවෙන් යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අපේක්ෂකයාට නියමිත දිනයේ දී විභාගය පටන් ගැනීමට ප්‍රථම විභාග මධ්‍යස්ථානයේ පරිපාලන නිලධාරියා වෙත දැනුම් දිය යුතු ය. එක් එක් අපේක්ෂකයාට නියම වී ඇති දිනය නොතකා එම අපේක්ෂකයන් සියල්ලම එක දිනයෙහි විභාග මධ්‍යස්ථානයේ පරිපාලක නිලධාරියා පරීක්ෂණය කරනවා ඇත. ඒ සම්බන්ධව යොදා ගෙන ඇති වැඩ පිළිවෙල පිළිබඳව අපේක්ෂකයින් විසින් අන් දැන්වීමක් දීම වුවමනා නොවේ.

(iii) මෙම විභාගය සඳහා පෙනී සිටින 1973 මැයි මස 31 වැනි දින වන විට සිය පත්වීම් ස්ථිර කර ඇති රජයේ සියළුම නිලධාරීන්ට තමන්ගේ විභාග ශාලාව වෙත කාර්යාලයීය යතුරු ලියන යන්ත්‍ර රැගෙන යාමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවසර දෙනු ලැබේ.

එහෙත් මෙම අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නා සෑම නිලධාරියෙකුගේම යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව ආපසු භාර දෙන බවටත් ඒවා පරිහරණය කිරීමේ දී සිදුවන අලාභ හානි ආදියක් වෙතොත් ඒවාට වගකියන බවටත් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලබාගත යුතුය.

(vi) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නිසි ශෝධන විට තමාගේ යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා අපේක්ෂකයෙකුහට දී තිබෙන දිනයෙහි වෙනසක් කර ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමකට සාමාන්‍යයෙන් ඉඩදෙනු නොලැබේ.

(v) විභාග කොමසාරිස් විසින් විභාග ශාලාවේ දී යතුරු ලියන යන්ත්‍ර සපයනු නොලැබේ.

(vi) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නිසි ශෝධන පිළිවෙල, නිරවද්‍යතාව සහ වේගය ගණන් ගනු ලැබේ.

### II වැනි කොටස

| | ලකුණු |
|---|---|
| සම්මුඛ පරීක්ෂණය ... ... | 50 |

පළමුවෙන්ම පවත්වනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයයි. එහි ප්‍රතිඵල අනුව අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට තරඟ ක්‍රමයට තෝරා ගන්නවා ඇත. කොළඹ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දිනය ඔවුන්ට කල් තියා දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු සංඛ්‍යාව විභාග කොමසාරිස්ගේ ද අදහස් විමසා, රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අපේක්ෂක සංඛ්‍යාව ඇබෑර්තු සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට ඉඩ තිබේ.

**15. ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ පත්වීම් දීම.**—සමර්ථ වන අපේක්ෂකයින්ගේ නම් ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර සුදුසු පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනවා ඇත.

**16. වෛද්‍ය පරීක්ෂණය.**—පත්වීම් දීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සාමාර්ථය ලැබිය යුතුය.

**17. මේ ව්‍යවස්ථාවලින් විස්තර නොකරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම් එය රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.**

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අප්‍රේල් මස 23 දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

**ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**විභාග අංකය :**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

යතුරු ලේඛක සේවයේ සාමාන්‍ය ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1973 ජූලි

1. මුලකුරු සමග අගට යෙදෙන නම :————.
   ස්ත්‍රී පුරුෂ භාවය :————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

3. සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයින් කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි.) :————.

4. ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

5. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති ස්ථානය :—
   පළමුවැනි තේරීම :————.
   දෙවැනි තේරීම :————.

6. සුදුසුකම් :

(අ) විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇත්තේ ඒ පිළිබඳ ගැසට් නිවේදනයේ කුමන ඡේදය යටතේ ද යන බව :————.

(ආ) උපන් දිනය :————.

(ඇ) අධ්‍යාපනික සුදුසුකම් :—

(i) විභාගයේ නම, පැවැත්වූ වර්ෂය හා මාසය : ————.

(ii) විභාග මධ්‍යස්ථානය හා විභාග අංකය : ————.

(iii) සමත් වූ විෂයයන් :————.
(සම්මාන සඳහන් කළ යුතු අතර, එක් එක් විභාගයේ විස්තර වෙන වෙනම දැක්විය යුතුය.)

(ඈ) විභාගයට පෙනී සිටීමට මබේ ඇති සුදුසුකම් පිළිබඳ අනිකුත් විස්තර :————.

7. ඔබ ආණ්ඩුව යටතේ කළ රක්ෂාවන් ද ඇතුළුව මීට කලින් කරන ලද රක්ෂාවල් ද ඒ ඒ රක්ෂාවල යෙදී සිටි කාලය ද ඒ එක එකින් අස්වී යාමට හේතු ද දක්වන්න :—

(i) වෙළඳ ආයතනයේ/සේවායාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ නම :————.

(ii) රක්ෂාවෙහි ස්වභාවය :————.

(iii) සේවා කාලය :————.

(iv) එම රක්ෂාවෙන් අස්වී යාමට හේතු වූ කරුණු : ————.

8. ඔබ යම්කිසි වරදකට කවදා හෝ වරදකරු කරනු ලැබ තිබේ නම් හෝ චෝදනා කරනු ලැබ තිබේ නම් හෝ සිතාසි කරනු ලැබ තිබේ නම් හෝ ඒ බව සඳහන් කරන්න. එසේ නම් ඒ දිනය ද වරදේ ස්වභාවය ද උසාවියේ නම ද නඩු නොම්මරය ද සඳහන් කරන්න :————.

9. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීමේ පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නොකරන ලද්දා වූ වලංගු මුද්දර බවත් ; මෙයින් දිවුරා සහතික කරමි :————.

(ii) මේ විභාගය හා සම්බන්ධ නීතිරීතිවලට යටත් වීමට මම එකඟ වෙමි.

10. මුද්දර කොටුව :————.

**සැලකිය යුතුයි.**—අයදුම්පතට රුපියල් 40 ක් වටිනා මුද්දර අලවා අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහ දාතම යොදා මුද්දර අවලංගු කළ යුතු ය. දැනට රජයේ සේවයේ නියුක්ත ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් රුපියල් 20 ක් වටිනා මුද්දර අලවා තමාගේ අත්සන සහ දාතම යොදා එම මුද්දර නිසි ලෙස අවලංගු කළ යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්ත එහෙත් ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත නොවන සියලුම නිලධාරීන් රුපියල් 40 ක් වටිනා මුද්දර ඇලවිය යුතු ය.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :————.

*....................................සේවයේ නියුක්ත/පදිංචි ........................නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්,, 1973 ......... මස ...... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

නම, පදවිය හා තරාතිරම :————.

ලිපිනය :————.

* දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි.

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුසු සකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයටම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය බාගයක් ගත වන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාමද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුලත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුලත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පෑවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යාම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්ම යෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදීයකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලු දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවෙන් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත් සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලිද තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද ෆයිල් කවර, කාර්ඩ් බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින්පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළ හොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩදෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටතට යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාගශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපෙක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපෙක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදකට අසු නොවිය යුතුයි.

16. විභාපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගතයුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොගවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාව විභාග ශාලාධිපතීන්ට දන්විය යුතුය. විභාගශාලාවේ දී ඔබටම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපාත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරිස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන් නවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරනතුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

5–30—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩර්යක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ක්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම හා රජයේ සේවයේ නොවන අයගේ නාම වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ සනක් යටතේ නීතුන් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම උසාවියේ රෙජිස්ට්‍රාර් මහතකු ගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුනම් ... ... ... | 20 | 0 |
| බෑඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 30 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට යෙදෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| සියළු කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 42 | 50 | 51 | 50 |

මාර්තුය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ හිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණ ය.

* තනි පිටපතක් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිල රු. ශ | තැපැල් ගාස්තු මෙරට රු. ශ |
|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මාසක් ඇතුළතදී එක් කොටසක් ... ... | 0 50 | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මාසකට පසු, එක කොටසක් | 1 00 | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මාසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් .. | 0 30 | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මාසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 60 | 0 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම **දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 73.04.06 සිකුරාද | ... | 73.03.28 බදද | දවල් 12.00 |
| | | 73.04.11 බදද | ... | 73.04.04 බදද | දවල් 12.00 |
| | | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදද | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදද | දවල් 12.00 |
| මැයි | ... | 73.05.04 සිකුරාද | ... | 73.04.25 බදද | දවල් 12.00 |
| | | 73.05.11 සිකුරාද | ... | 73.05.02 බදද | දවල් 12.00 |
| | | 73.05.18 සිකුරාද | ... | 73.05.09 බදද | දවල් 12.00 |
| | | 73.05.25 සිකුරාද | ... | 73.05.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි | | 73.06.01 සිකුරාද | ... | 73.05.23 බදද | දවල් 12.00 |
| | | 73.06.08 සිකුරාද | ... | 73.05.30 බදද | දවල් 12.00 |
| | | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.06 බදද | දවල් 12.00 |
| | | 73.06.22 සිකුරාද | ... | 73.06.13 බදද | දවල් 12.00 |
| | | 73.06.29 සිකුරාද | ... | 73.06.20 බදද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.